www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# උතුරු කොරියානු න්‍යෂ්ටික අර්බුදය නව අවධියකට එළඹෙයි

## North Korean nuclear crisis enters a new stage

ජෝන් චැන් විසිනි

2009 ජුනි 19

උතුරු කොරියාව විසින් මැයි 25 දින සිදුකරන ලද න්‍යෂ්ටික අත්හදා බැලීම සහ පියොංජියන් විසින් තමන්ගේ න්‍යෂ්ටික ආයුධ වැඩ පිළිවෙල, දියුනු කරන ලද යුරේනියම් යොදා වැඩිදියුනු කිරීමේ තර්ජනයන්ට එරෙහිව තදබල සම්බාධක පනවන ලද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ යෝජනාවක් මගින් කොරියානු අර්ධද්වීපයේ දිග් ගැස්සුන අර්බුදය නව සහ වඩාත් අනතුරුදායක අවධියකට එළඹ ඇත.

ජපානයේ ප්‍රබල පිටුබලය ලැබ එක්සත් ජනපදය විසින් කෙටුම්පත් කරන ලද එක්සත් ජාතීන්ගේ 1874 යෝජනාව මගින් උතුරු කොරියාව සමග සුලු අවි හැර අනෙකුත් යුද ආයුධ වෙළඳාම තහනම් කරයි. චීනය ඉන් බැහැරව සිටින බව අවධාරනය කල අතර රුසියාව, ජාත්‍යන්තර මුහුදේදී උතුරු කොරියානු නැව් විමර්ශනය කිරීම පිලිබඳව කෙටුම්පත යලි සැකසිය යුතු බවට ඉල්ලුම් කරමින් එයට එකතු විය. බලවතුන් දෙදෙනාම, එක්සත් ජනපදය සහ එහි මිත්‍ර බලයන් එවැනි පරීක්ෂා කිරීමක් මිලිටරි ගැටුමක් බවට පුපුරා යා හැකි ප්‍රකෝපකරනයක් සැකසීම සඳහා ගසා කනු ඇතැයි බියෙන් පසුවෙති.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ 'අධිකාරිය ලද්දවුන්ගේ' සිට සියම එක්සත් ජාතීන්ගේ සාමාජික ජාතීන්ට න්‍යෂ්ටික සම්බන්ධ ද්‍රව්‍ය අන්තර්ගතයැයි විශ්වාස කරන උතුරු කොරියාවෙන් එන සහ එදෙසට ගමන් කරන නැව් විමර්ශනය කිරීමට 'කැඳවා සිටීමට' එක්සත් ජනපදය එකඟ වූවේ ය. ඔවුන්ගේ නැව්වලට නැගීමට අවසර දීමට එකඟ නොවූ රටවල් පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ නැව් "ප්‍රමානවත් සහ පහසුකම් සහිත" වරායකට යොමු කල යුතුය.

"නෞකා භාන්ඩ සුපරීක්ෂා කිරීම් වැනි සම්බාධක අතිශය වියවුල්කාරී මෙන්ම සංවේදී කාරනාවක් වන බවද, මෙයට සම්බන්ධ රටවල් විචක්ෂනශීලිව හා සැලකිය යුතු පදනම් මත ක්‍රියාත්මක විය යුතු බව අපි විශ්වාස කරන්නෙමු'' යි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ චීන නියෝජිත ෂැන් යෙෂුයි මාධ්‍යයට පවසුවේය. කෙසේ වෙතත් චීනය, උතුරු කොරියාව ප්‍රථම න්‍යෂ්ටික අත්හදා බැලීම සිදුකල දෙවැනි වසරේ සිට විරෝධය පලකරමින් සිටි වැඩ පිලිවෙලට එකඟ වූවේ ය.

තවද බීජිනය, "උතුරු කොරියාවේ මිසයිල වැඩ පිලිවෙලට හා ඩබ්ලිව්එම්ඩී වර්ධනය කිරීමට පිටුබලය සපයන සියලුම මූල්‍ය ගනු දෙනු මත සම්බාධක පැනවීමට සහ මානුෂීය සහ මිසයිල වැඩ පිලිවෙලවල් නතර කිරීමට දෙන ආධාර හැර, සෙසු සියලුම ආධාර තහනම් කිරීමට එකඟ විය.

පියොංජියොංහි තවදුර හිතුවක්කාරී ක්‍රියාවන් මගින්, පියොංජියොංවලට පමනක් නොව බීජිං වලට තර්ජනයක් වියහැකි න්‍යෂ්ටික ආයුධ අත්කර ගැනීම ද ඇතුලත්ව ඔවුන්ගේ මිලිටරිය පුලුල් කර ගැනීම සඳහා ජපානය සහ දකුනු කොරියාවට ව්‍යාජෝක්තියක් සපයා දෙනු ඇතිය යන බියෙන් චීනය පසු වේ. ඒ අතරම එක්සත් ජනපදයට සහ එහි මිතුරු බලවතුන්ට ගසා කෑ හැකිවන අයුරින් උතුරු කොරියාවේ දේශපාලන බිඳ වැටීමක් චීනයට උවමනා නැත.

අඟහරුවාදා දින, චීන විදේශ අමාත්‍ය ප්‍රකාශක කීත් ගැන්ග් "ඉවසීමෙන් පසුවන ලෙස හා හික්මීමෙන් ක්‍රියා කරන ලෙසත්, උපදෙස් හා සාකච්ඡා කිරීම මගින් අදාල කාරනාවන් විසඳා ගැනීමට මෙන්ම තත්ත්වය අතිශය නරක අතට හැරිය හැකි මොනයම්ම ක්‍රියාවකින් වැලකී සිටීමටත්" සියලුම පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටියේ ය. උතුරු කොරියානු න්‍යෂ්ටික වැඩපිලිවෙල සම්බන්ධ දිග් ගැස්සුන අර්බුදය විසඳා ගැනීමට, චීනය, එක්සත් ජනපදය, ජපානය, රුසියාව සහ කොරියානු දෙරට ද ඇතුලත් සය පාර්ශවීය සාකච්ඡාවන්ට යලි ප්‍රවේශයක් ලබා ගැනීමට චීනය බලපෑම් කරමින් සිටී.

කෙසේවෙතත්, තමන් යලි සය පාර්ශවීය සාකච්ඡාවන්ට ප්‍රවේශ නොවනු ඇතැයි පියොංජියන්

ප්‍රකාශ කර තිබේ. එය, ජාත්‍යන්තර න්‍යෂ්ටික නිරීක්ෂකයින් රටින් නෙරපා දැමූ අතර, යොන්බියොන්ග්හි තම පරමාණු මධ්‍යස්ථානයන් යලි ආරම්භ කර තිබේ. එක්සත් ජාතීන්ගේ යෝජනාව සම්මත කිරීමෙන් අනතුරුව, එහි බලශක්ති ප්‍රතික්‍රියාකාරකයන්ට ඉන්ධන සැපයිය හැකි, යුරේනියම් බලගැන්වීමේ වැඩ පිලිවෙලක් තමන් සතුව ඇති බව උතුරු කොරියාව විසින් ප්‍රථම වරට පිලිගෙන තිබේ. එමෙන්ම එහි ප්ලුටෝනියම් ඉතිරි පහදු ආයුධ බවට පරිවර්තනය කිරීමට හැකි බව ප්‍රකාශ කර ඇති අතර තමන්ගේ නැව්වලට ගොඩවීමට දරන්නාවූ ඕනෑම උත්සහායක් යුද ක්‍රියාවක් වශයෙන් සලකන බවට අනතුරු ඇඟවීය. උතුරු කොරියාව තවත් දිග දුර මිසයිලයක් අත්හදා බැලීමට සූදානම් කරමින් තිබෙන බව එක්සත් ජනපද සහ දකුනු කොරියානු නිලධාරින් ප්‍රකාශ කලහ.

අර්බුදගත ස්ටැලින්වාදී පාලන තන්ත්‍රය විසින් කරනු ලබන මෙවැනි මවාපෑම් අධිරාජ්‍යවාදයට එරෙහි මොනයම්ම හෝ සැබෑ අරගලයක් සමග කිසිදු සම්බන්ධයක් නොමැතිවා පමනක් නොව, කොටුවී සිටින කුඩා ජාතියේ ආරක්ෂාව ශක්තිමත් කිරීමට කිසිවක් නොකරනු ද ඇත. එහි අරමුන වී පැවතියේ අභ්‍යන්තරව පාලක ප්‍රභූව තුල සිදු වී ඇති පිපිරීම්වලට මුක්කු ගැසීම සහ කිසියම් ආකාරයක අවකාශයක් පාදා ගැනීම සඳහා ඇමරිකාව සහ එහි සගයන් මත පීඩනය යෙදීමය.

ජුනි 15 වෙනි දින එක්සත් ජනපද ජාතික බුද්ධි අංශ ප්‍රකාශනයකට අනුව, උතුරු කොරියාවේ දෙවන න්‍යෂ්ටික අත්හදා බැලීම "දල වශයෙන් කිලෝ ටොන් කීපයක එකක්" විය. 2006 වසරේ එහි ප්‍රථම අත්හදා බැලීම හරියට ම කිලෝ ටොන් එකක් වශයෙන් ඇස්තමේන්තු කර තිබුනි. 1945 වසරේ දී ජපානයට දමන ලද ඇමරිකානු පරමානු බෝම්බය සමග සසඳ බැලු විට පවා උතුරු කොරියාවේ ආයුධ ප්‍රාථමික වනවාක් මෙන්ම අත්හදාබැලීම් සාර්ථක වී ඇත්තේ පාර්ශවීය වශයෙන් පමනි.

වඩාත් ගැටුම්කාරී ආස්ථානයක් ඇති කරගැනීමට ඔබාමා පාලන තන්ත්‍රය විසින් උතුරු කොරියාවේ ප්‍රකාශනය යොදාගෙන ඇත. ජනාධිපති බරක් ඔබාමා සහ සංචාරක දකුනු කොරියානු ජනාධිපති ලී මයන්ග් අතර මෙම සතියේ පැවති හමුවේ පනිවුඩය වූයේ සය පාර්ශවීය සාකච්ඡාවන් සහ 2007 වසරේදී එකඟ වූ ගිවිසුම අවසන්කර දමා ඇති බවය.

"යුදකාමී ආකාරයකින් හැසිරීමේ ස්වභාවයක් අතීතයේ දී උතුරු කොරියාවට තිබුනි. එය ඇති තරම් කාලයක් කල්බලන්නේ නම්, එවිට ආහාර ද්‍රව්‍ය සහ තෙල් සමගින් සහනශීලී නය මෙන්ම ලාභ ප්‍රයෝජන තොගයක් ප්‍රථිඵල වශයෙන් ලබා ගනු ඇත" ඔබාමා අඟහරුවාදා පැවසුවේ ය. "අපගේ පනිවිඩය නම් මෙහි දී 'අප' කියනවිට ඉන් සරලව ම අදහස්වන්නේ එක්සත් ජනපදය සහ කොරියානු සමූහාන්ඩුව පමනක් නොවේ. මා සිතන හැටියට, ජාත්‍යන්තර ප්‍රජාව ම බව මා කිව යුතුය - අපි එම මෝස්තරය කඩා දැමීමට බලාපොරොත්තුවෙමු." ඔබාමා අනතුරු අඟවුවේ ය.

"එක්සත් ජනපද න්‍යෂ්ටික අවි ඇතුලත් බලගතු ආරක්ෂක විදහා පෑමකට" එක්සත් ජනපදය සහ දකුනු කොරියාවේ අඛන්ඩ කැපවීම පිලිබඳව ඒකාබද්ධ ප්‍රකාශනයකින් අවධාරනය කිරීම, ඇමරිකානු න්‍යෂ්ටික අවි ගබඩාවේ අනුල්ලංඝනීය අධිකාරිය ගැන පැහැදිලි සඳහනකි. "අපගේ දෙරට අතර අපට පවතින ශක්තිමත් සබඳතාව සහ එක්සත්භාවය දෙස බලන විට, ඔවුන්ට පසුතැවිලිවීමට සිදුවනු ඇති ඕනෑම පියවරයන් ක්‍රියාත්මක කිරීමේ දී උතුරු කොරියානුවන් දෙවරක් සිතනු ඇත." ලී වාර්තාකරුවන්ට ප්‍රකාශ කලේ ය. සය පාර්ශවීය සාකච්ඡාවන්ට ආපසු යාමක් පිලිබඳ කතාවන් ගසා බසා දැමූ, දක්ෂිනාංශික මහා ජාතික පක්ෂයේ ලී, එම සාකච්ඡාවන් පියංජියන් විසින් සැබෑවට ම යොදා ගනු ලැබුවේ න්‍යෂ්ටික ආයුධ ගොඩ නැගීමට 'කල් ගැනීම සඳහා' බව වෝල් ස්ට්‍රීට් ජර්නලය කියා සිටියේ ය.

වඩාත් ම එලිදරව්කාරී අදහස් ප්‍රකාශ කරනු ලැබුවේ, ඉරිදා එන්බීසියේ "මාධ්‍යය හමුව" ට කතා කල ඇමරිකානු උප ජනාධිපති ජෝයි බිඩ්න් විසිනි; "අප එක්සත් ජාතීන්ගේ යෝජනාව ක්‍රියාවට දැමීමට බලාපොරොත්තු වෙමු. එය විසින් යුද ක්‍රියාවක් යැයි කියන්නේ වී නමුත්, දැන් මෙය අපට, උතුරු කොරියාව මත, පීඩනය යෙදීමේ කාරනාවකි." වෙනත් වචනවලින් කියතොත්, උතුරු කොරියාව සමග මිලිටරි ගැටුමකට හේතුවිය හැකි ක්‍රියාවක් වුවත්, වොෂිංටනය සම්බාධක පිලිවෙත ඉදිරියට ගෙන යනු ඇත. "මෙය බොහෝ බියකරු දෙවල් කියන පාලන තන්ත්‍රයකි. එය කලාපයේ අස්ථාවර කරන බලයකි..." බිඩ්න් තව දුරටත් පැවසුවේ ය.

සත්‍ය වශයෙන්ම එක්සත් ජනපදය වත්මන් අර්බුදයට ප්‍රධාන වශයෙන් වගකිව යුතුය. උතුරු කොරියාව, ඉරානය සහ ඉරාකය සමග 'සතුරු අක්ෂයක' පාර්ශවයක් ලෙස 2002 වසරේ දී බුෂ් පාලන තන්ත්‍රය විසින් නම් කරනු ලැබී ය. එම වසරේ ම ඔක්තෝබර් මාසයේ දී බුෂ් පාලන තන්ත්‍රය විසින් උතුරු කොරියානු යුරේනියම් බලගැන්වීමේ වැඩ පිලිවෙලක් පිලිබඳ ව්‍යාජෝක්තියක් ප්‍රයෝජනයට ගනිමින්, කලින් ක්ලින්ටන් පාලන තන්ත්‍රය විසින් අත්සන් කරන ලද 1994 එකඟතා වැඩ පිලිවෙල කටුගා දැමුවේ ය. මෙයට ප්‍රතිචාරයක් වශයෙන්, උතුරු කොරියාව න්‍යෂ්ටික නිරවිකරන ගිවිසුමෙන් ඉවත් වූ අතර තමන්ගේ කුඩා න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරකය... සහ

ප්ලුටෝනියම් ප්‍රතිබල ගැන්වීමේ මධ්‍යස්ථානය නැවතත් ක්‍රියාත්මක කලේ ය.

බුෂ් මෙන්ම ඔබාමා සඳහන් කලේ උතුරු කොරියාවේ .... නරක හැසිරීමට තමන් 'සංතෝෂම්' නොදෙනු ඇති බවයි. කෙසේවෙතත් වත්මන් තත්ත්වයට පාර කපන ලද, පියොංජියන් සමග එකඟ වූ තමන්ගේ පාර්ශවයේ යුතුකම් ඉෂ්ට කිරීමට බලයේ සිටි ඇමරිකානු පාලන තන්ත්‍රයන් මුලුමනින්ම අසමත් ව තිබේ. එකඟතා වැඩ පිලිවෙලේ කොටසක් වු සැහැල්ලු ජලබල ප්‍රතික්‍රියාකාරකයන් දෙක ගොඩ නැංවීමට ජනාධිපති ක්ලින්ටන් අපොහොසත් විය. බුෂ් කල එකම කර්තව්‍ය වුයේ, දැන් ඔබාමා පාලන තන්ත්‍රය විසින් ආපසු හැරවීමට තර්ජනය කරන, ත්‍රස්තවාදයට අනුබල දෙන රාජ්‍යයන් පිලිබඳ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු ලැයිස්තුවෙන් උතුරු කොරියාව අකමැත්තෙන් ඉවත් කිරීම පමනකි. පියොංජියන් විසින් ප්‍රමුඛතාවෙහිලා සැලකු කාරනාවන් වන සබඳතාවන් සමාන්‍ය තත්ත්වයට ගෙන ඒම හෝ 1953 කොරියානු යුද්ධය අවසන් වීමෙන් පසුව පවත්වාගෙන ගිය එක්සත් ජනපද සම්බාධක ඉවත් කිරීමට වොෂිංටනය එකදු පියවරක් වත් ගන්නේ නැත.

ඔබාමා පාලන තන්ත්‍රයේ ආස්ථානය වන්නේ තමන්ගේ සගයා වන උතුරු කොරියාව නිවැරදි ගමන් පථයට ගැනීම සඳහා චීනය මත වැඩි පීඩනයක් යෙදීමට ය. බීජිනය නිසැකව ම තමන්ගේ කීර්තියේ සැලකිය යුතු කොටසක් අත්කර ගනු ලැබූ සය-පාර්ශවීය සාකච්ඡාවන් බිඳවැටීම ගැන ඉච්චා භංගත්වයට පත්ව සිටී. එමෙන්ම උතුරු කොරියාව තමන්ගේ බලශක්තිය, ආහාර සහ මූලික පාරිභෝගික භාන්ඩයන්ගේ ඉමහත් කොටසක් සඳහා චීනය මත රැඳී සිටීමේ හේතුවෙන්, දූප්පත් රාජ්‍ය ආර්ථික වශයෙන් දන ගැස්වීමේ මාධ්‍යයන් චීනයට තිබේ. කෙසේ වෙතත්, මෙම භාන්ඩයන් අත්හිටුවීම මගින් බීජිං, චීනය තුලම අස්ථාවරකාරී ගැටුමක් ඇති කරනු ලැබිය හැකි හා තමන්ගේ දේශසීමාවන් මත ඇමරිකන් හිතැති රාජ්‍යයක් සඳහා දොරටුව විවෘත කරන ඇති උතුරු කොරියාව තුල දේශපාලන අර්බුදයකට යහමින් සහභාගී වී ඇත.

ප්‍රධාන බලයන් විසින් වැරදි ගනන් බැලීමක අනතුර සෑමවිටම දරාසිටින, ඊසානදිග ආසියාවේ ආතතීන්වල තියුනු වර්ධනයක් විවෘත ගැටුමක් කරා මෙහෙයවෙමින් තිබේ.

© www.wsws.org